**03-09-2024 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ කිසිම අපිරිසිදු මනුෂ්‍යයෙකුට ඇලුම් නොකළ යුතුයි. මන්ද, ඔබ දැන් පිරිසිදු ලෝකය වෙත යා යුතු වන බැවිනි. ඔබ ඇලුම් කළ යුතු එකම තැනැත්තා ඒ එකම එක පියායි.

**ප්‍රශ්නය:** දරුවනි, ඔබ ශෝකයට පත් නොවිය යුත්තේ කුමක් අරභයා ද සහ ඒ සම්බන්ධව ඔබ ශෝකයට පත් නොවිය යුත්තේ ඇයි?

**පිළිතුර:** ඔබ ඔබගේ ශරීරය සම්බන්ධව සුළුවෙන් හෝ ශෝකයට පත් නොවිය යුතුයි. මන්ද, එය ඔබට ඉතා වටිනා බැවිනි. ජීවාත්මයන් ශරීරය මත හිඳ බාබා සිහි කිරීමෙන් විශාල ලොතරැයියක් දිනාගන්නවා. බාබා පිළිබඳ සිහි කිරීම නිරන්තරයෙන් රැක ගැනීම තුළින් ඔබ සැම විටම සතුට නැමැති පෝෂණය ලබයි.

ඕම් ශාන්ති. ඉතා ඈත දනව්වේ පදිංචිකරුවන් වන සුමිහිරි ආධ්‍යාත්මික දරුවන් ඈත දනව්වේ සිට පැමිණි මගීන්ය. ජීවාත්ම දැන් ඔබේ ඈත දනව්වේ සංදිස්ථානය වෙත යාමට උත්සාහ දැරිය යුතුයි. ඔබ පමණයි දන්නේ ඔබ ඈත දනව්වේ පදිංචිකරුවන් බව. ඔබ ඒ ඈත දනව්වේ පදිංචිකරුවා වන බාබාට කතා කරනවා. ඔබ කිව්වා: පැමිණ අපව ඈත දනව්ව වෙත ගෙන යන්න කියා. බාබා ඈත දනව්වේ පදිංචිකරුවා දැන් පැමිණ සිටිනවා ඔබව එහි රැගෙන යාමට. ඔබ දැන් ඔබගේ ශරීරය තුළ සිටින බැවින් ඔබ ආධ්‍යාත්මික මගියෙකු වී තිබෙනවා. ඔබ වන ඒ ජීවාත්මය තමයි ගමන් කරන්නේ. ජීවාත්මය තම ශරීරය මෙහි අතහැර, ජීවාත්මය එම දේශය වෙත ගමන්කරනවා. ජීවාත්ම යන්නේ කොහිද? ඔබ ඔබගේ ආධ්‍යාත්මික ලෝකයට යනවා. මේ ලෝකය භෞතිකයි සහ එම ලෝකය ආධ්‍යාත්මිකයි. බාබා ඔබට පැහැදිලි කර දුන්නා, ඔබ දැන් නිවස වෙත යායුතු බව. ඔබ ඉහළ සිට තම චරිත කොටස රඟ පෑමට මෙහි පැමිණියා. මේ ලෝකය විශාල වේදිකාවක්. ඔබ තම චරිතය මේ රඟ මඩලෙහි රඟ පෑ පසුව තම නිවහන වෙත යනවා. නාටකය හමාර වූ විට පමණයි සියල්ලන්ටම යා හැකි වනුයේ. ඔබ මෙහි හිඳ සිටින විට ඔබේ බුද්ධිය සම්බන්ධ වී තිබිය යුත්තේ නිවස සහ රාජධානිය වෙතයි. මෙම කරුණ තදින්ම සිහියේ තබාගන්න. මන්ද, ඔබේ අවසාන සිතිවිල්ල ඔබගේ දෛවය තීරණය කරයි. ඔබ දැන් මෙහි ඉගෙනුම ලබන ශිෂ්‍යයින් ඔබ තේරුම්ගන්න පරමාත්ම දෙවියන්, ශිව බාබා ඔබට උගන්වනවා. මේ මංගල්‍ය වූ සංගම යුගයේ හැර සැම කාලයකම බාබාට ඔබට ඉගැන්වීමට බැහැ. මුළු වසර 5000ටම බාබා, අශරීරික දෙවියන් මේ යුගයේදී පමණයි ඔබට ඉගැන්වීමට පැමිණෙන්නේ. මේ සම්බන්ධව ඔබ තුළ දැඩි විශ්වාසයක් තිබිය යුතුයි. මේ ඉගැන්වීම ඉතාම පහසුයි. ඔබ දැන් නිවස වෙත යා යුතුයි. මේ ලෝකයේ සියලුම දෙනා ඒ නිවහනට කැමැත්ත ඇත. සැම කෙනෙකුටම මුක්තිය ලැබීමට අවශ්‍ය වී තිබෙනවා. නමුත් කිසිම කෙනෙකු එහි අර්ථය දන්නේ නැහැ. මෙකළ අනෙක් මිනිසුන්ගේ බුද්ධිය කෙබඳුද සහ ඔබේ බුද්ධිය මොනවගේද? ඒ අතර විශාල වෙනසක් තිබෙනවා. ඔබ දරණ උත්සාහයේ අනුපිළිවෙළට ඔබගේ බුද්ධිය පිරිසිදුයි. මුළු ලෝක චක්‍රයෙහිම මුල, මැද සහ අග පිළිබඳ හොඳ පැහැදිලි අවබෝධයක් ඔබට තිබිය යුතුයි. ඔබේ හදවතින්ම දැන් ඔබ අවබෝධ කර ගත යුතුයි, අනිවාර්යෙන්ම සාමාන්‍ය මනුෂ්‍යභාවයේ සිට නාරායන බවට පත්වීම උදෙසා ඔබ උත්සාහ දැරිය යුතු බව. පළමුව ඔබ මෙහි සිට ඔබගේ නිවහන වෙත යනවා. එබැවින් ඔබ එහි යා යුත්තේ සතුටින්. සත් යුගයෙහිදී දේවී දේවතාවන් තම ශරීරය අතහැර අනෙක් ශරිරය ගන්නේ ඉතා සතුටින්. එලෙසම ඔබ ඔබගේ වර්තමාන ගෙවී යන ශරිරය ඉවත් කළ යුත්තේ ද සතුටිනි. මේ ශරීරය ඉතා වටිනා බැවින් ඒ ගැන ශෝකයට පත් නොවිය යුතුයි. ඔබගේ වර්තමාන ශරීරය මාර්ගයෙන් තමයි ඔබ බාබාගෙන් ලොතරැයිය දිනාගනුයේ. ඔබ පාරිශුද්ධත්වයට පත්වන තෙක් ඔබට නිවහන වෙත යා නොහැකියි. යෝගා බලයෙන් ඔබේ පව් බර ඉවත් කරගන්නා විට එය නිරන්තරයෙන් බාබා සිහිකිරීමට ඔබට උපකාර කරයි. එසේ නැතහොත් ඔබට දඬුවම් විඳිමට සිදුවේවි. ඔබ අනිවාර්යෙන්ම පාරිශුද්ධත්වයට පත්විය යුතුයි. ලෞකික පවුලක දරුවෙක් නීතියට පටහැනි යම් නරක හෝ අපිරිසිදු වැඩක් කළ හොත් තාත්තා පැමිණ කෝටුවක් ගෙන තරහින් ඔහුට ගහනවා. දෙමාපියන් කැමති නැහැ කවුරු හෝ නීතියට පටහැනි වනවාට. දරුවනි, මේ අසීමිත පියා කියනවා : ඔබ තව වැඩි කළක් මෙහි ඉන්නේ නැහැ. ඔබ දැන් අපිරිසිදු හෝ දූෂිත අය කිසිවෙකු නැතිව නව ලෝකයට යනවා. බාබා, පාරිශුද්ධත්වයට පත්කරන්නා පැමිණි විට පමණක් ඔබට ඔහු මෙන්ම පාරිශුද්ධත්වයට පත්විය හැකියි. බාබා කියනවා : මගේ උපත දිව්‍යමය මෙන්ම අසහාය‍ජනකයි. අනෙක් ජීවාත්මයන්ට මා ඇතුළු වන්නා සේ ශරීරයකට ඇතුළු විය නොහැකියි. ආගමික

නිර්මාතෘවරු පැමිණි විට එමම ජීවාත්මයද යම් කෙනෙකුට ඇතුළු වනවා. නමුත් එය මීට වෙනස් දෙයක්. මම සියලුම දෙනා නිවස වෙත ගෙන යාමටයි එන්නේ. ඔවුන් ඉහළ සිට තම චරිත කොටස සම්පූර්ණ කිරීමට පහළට එනවා. මම පැමිණි විට, ඔබ පළමුව නව ලෝකයට පැමිණියේ කෙසේද සහ පසුව මා පැමිණ සියලු දෙනාවම නිවහන වෙත ගෙන ගිය හැටි ඔබට පැහැදිලි කර දෙනවා. ස්වර්ණමය යුගය නමැති නව ලෝකයේ කොක්කු නැහැ. බාබා දැන් පැමිණියේ ඔබව කොකුන් බවින් හංසයෝ බවට පත් කිරීමටයි. දැන් ඔබ මුතු පමණක් තෝරා ගන්නා හංසයින් බවට පත්වනවා. සත් යුගයේදී ඔබ මෙවන් දැනුම නමැති මිණිමුතු ලබන්නේ නැහැ. මෙහිදී තමයි ඔබ දැනුම නමැති මිණිමුතු තෝරා ගන්නා හංසයින් බවට පත්වනුයේ. බාබා පැහැදිලි කර දෙනවා කොකුන්ගෙන් හංසයින් බවට ඔබ පත්වනුයේ කෙසේද කියා. ඔබව දැන් හංසයින් බවට පත්කළා. දේවී දේවතාවන් හංසයින් ලෙස හඳුන්වන අතර යක්ෂයින් කොකුන් ලෙස හඳුන්වනවා. ඔබ දැන් සියලුම දෙනාට ඔවුන්ගේ දුහුවිලි විනාශ කර මේ මිණිමුතු අහුලා ගැනීමට උපකාර කළ යුතුයි. ඔබ මිලියන වාරයක් වාසනාවන්ත අය ලෙස හඳුන්වනවා. ඔබගේ සෑම පියවරකදීම ඔබ තබන සෑම සනිටුහනකින්ම ඔබ මිලියන වාරයක් උපයයි. ශිව බාබාට මිලියන වාරයක් ඉපැයීමට හැකි වූ කිසිම අවස්ථාවක් උදා වී නැත. ඔහු ඔබව මිලියන වාරයක් වාසනාවන්ත කරවනවා. බාබා කියනවා : මම ඔබව ලෝක පාලකයින් බවට පත්කරවනවා. ඔබ මේ කරුණු ඉතා පැහැදිලිව අවබෝධ කරගත යුතුයි. මිනිස්සු දිව්‍යලෝකයක් තිබෙන බව පිළිගන්නවා, නමුත් එය ඇතිවන්නේ කවදාද තිබුණේ කවදාද කියා ඔවුන් නොදනී. ඔවුන් සියලු දෙනා දැන් ඉන්නේ අඳුරේ එහෙත් ඔබ දැන් ආලෝකය කරා ගොස් තිබෙනවා. ලක්ෂ්මී සහ නාරායන තමයි ලෝක පාලකයින්, ඔවුන් ඒ තත්ත්වයට පැමිණුනේ කවදාද සහ කෙසේද? කිසිවෙකු මේ ගැන දන්නේ නැහැ. මෙය වසර 5000ක ගැටළුවක්. බාබා පැමිණ මේවා පැහැදිලි කරනවා; ඔබ පැමිණ ඔබගේ චරිත කොටස රඟ පානවා සේ මමත් පැමිණ මට අයත් චරිත කොටස රඟ පානවා. ඔබ මට කථා කරමින්, මට ආරාධනා කළා: අහෝ බාබා, පැමිණ අපිරිසිදු අපව පිරිසිදු කරන්න! ඔබ වෙනත් කිසිවෙකුට මෙලෙස පවසන්නේ නැහැ. මිනිස්සු තම ආගමික කර්තෘවරයාට පවා මේ ලෙස කියන්නේ නැහැ. පැමිණ සියලු දෙනාවම පාරිශුද්ධත්වයට පත් කරන්න යැයි ඔවුන් කියන්නේ නැහැ. ක්‍රිස්තුස්වහන්සේට පමණක් නොව බුදුන්වහන්සේටවත් පාරිශුද්ධත්වයට පත්කරන්නා යැයි කියන්නේ නැහැ. ගුරු කෙනෙක් තමයි ගැළවීම් ලබා දෙන්නේ. ආගමික කර්තෘවරු පැමිණි පසුව ඔවුන්ගේ අනුගාමිකයින් ඔවුන්ව අනුගමනය කරනවා. බාබා අමරණීයත්වයේ පිළිරුව පමණයි සියල්ලන්ටම ගැළවීම ලබාදෙන මාර්ගය පෙන්වන්නේ. සත්ගුරු යන වචනය ගත් කළ එය ඉතා නිවැරදියි. සියලුම ආගම් හැරුණු විට, සික් ආගමිකයින් තමයි නිවැරදි වචන භාවිතා කළේ. අමරණීයත්වයේ පිළිරුව සත්ගුරු යනුවෙන් ඔවුන් ශබ්ද නගා ගායනා කළා. ඔවුන් එය පවසන්නේ දැඩි භක්තියකින් යුතුවයි. ඔවුන් කියනවා සත්ගුරු තමයි අමරණීය පිළිරුව. නමුත් ඔහුට ස්වරූපයක් නොමැති නම් ඔහු සත්ගුරු වන්නේ කෙසේද? ඔහු ගැළවීම ලබාදෙන්නේ කෙසේද? සත්ගුරු ඔහුම පැමිණ තමාව හඳුන්වා දිය යුතුයි. ඔහු කියනවා : මම ඔබ උපත් ගන්නා ලෙස උපත් ගන්නේ නැහැ. අනෙක් සෑම තැනකම ශාරීරික මනුෂ්‍යයින් දැනුම පවසන නමුත් තමන්ටම කියා ශරීරයක් නොමැති ආධ්‍යාත්මික පියා, අශාරීරික කෙනා ඔබට පැහැදිලි කරනවා. මේ පරිවර්තනය හරියට දිවා රෑ වගේ. මේ කාලයේදී මනුෂ්‍යයින් විසින් කරනු ලබන සියලුම දේ වැරදි සහගතයි. මන්ද, ඔවුන් අනුගමනය කරන්නේ රාවන්ගේ උපදෙස්. දැන් රාවන්ගේ රාජ්‍ය සමයයි. එනිසා, එහි සිටින සියලු දෙනා තුළම පාපයන් පහ අන්තර්ගත වනවා. එමනිසා, බාබා මේ සියලුම කරුණු ගැන ඔබට පැහැදිලි කර දෙනවා. එසේ නොමැති නම්, මුළු චක්‍රයම ගැන ඔබ දන්නේ කෙසේද?ලෝක චක්‍රය ක්‍රියාත්මක වනුයේ කෙසේද කියා ඔබ දැන සිටිය යුතුයි. ඔබ බාබාගෙන් ඇසිය යුතු වන්නේ නැහැ ඔබට පැහැදිලි කර දෙන ලෙස. බාබා නිරන්තරයෙන්ම ඔබට පැහැදිලි කරදෙනවා. එක ප්‍රශ්නයක්වත් එහිදී ඔබට ඇසිය යුතු වන්නේ නැහැ. පරමාත්ම දෙවියන් ඔබේ පියාය. එනිසා පියෙකුට අයත් කාර්යය තමයි ඔබට සියලු දේ කීම සහ ඔහු විසින්ම සියලු දේ කිරීම. පියෙක් අනිවාර්යෙන්ම තම දරුවන් පාසලකට ගෙන යනවා. පියෙක් තම දරුවන් වැඩකට යවා ඔවුන්ට කියනවා අවු: 60ක් වයසට ගිය පසු සියලු දේ අතහැර දෙවියන්ව සිහිකරන්න කියලා: ඔවුන් වේද ග්‍රන්ථ ඉගෙන ගෙන වන්දනාමානාදියත් සිදුකළ යුතුයි. පසුගිය චක්‍ර භාගය පුරාම ඔබ වැඳුම් පිදුම් කරමින් සිටියා. ඔබ කිව්වා පාරිශුද්ධ වෙන එක එතරම් පහසු දෙයක් වෙන්නේ කොහොමද කියලා. පසුව ඔබ භක්තිය සම්පූර්ණයෙන්ම අතහැර දැම්මා. සියලු දෙනාම කරන්නේ භක්තිය, එහෙත් ඔබ ගන්නේ දැනුමයි. ඔවුන් තවම සිටින්නේ අන්ධකාරයේ, එහෙත් ඔබ දැන් දවස වෙත, දිව්‍යලෝකය වෙත පියවර නගනවා. ගීතාවෙහි ලියා තිබෙනවා: "මන්මනාභව්!" කියලා. මෙහි පහදාදීම ඉතා ප්‍රසිද්ධයි. ගීතාව ඉගෙන ගත් කෙනෙකුට මේ පහදාදීම් වටහා ගැනීම ඉතා පහසුයි. ගීතාව ලියා තිබෙන්නේ ඉතාමත් සරළ ආකාරයටයි. මිනිස්සු තම ජීවිතය පුරාවටම ගීතාව අධ්‍යයනය කළද, ඔවුන්ට කිසිවක් අවබෝධ කරගත නොහැක. ඒ ගීතාවෙහිම කියැවෙන

දෙවියන් පැමිණ ඔබට උගන්වනවා. එමනිසා, ඔබ අපිරිසිදු බවින් පිරිසිදු බවට පත්වනවා. අපි දැන් ගීතාවෙහිත් කියැවෙන ඒ ශිව බාබාට සවන් දී පසුව අන්‍යයන්ට එය පවසා අප පිරිසිදු වනවා. මේවා බාබාගේ උත්තරීතර වචනයි. මේ ඒ පහසු රාජයෝගාවමයි. මිනිස්සු අන්ධ විශ්වාසයේ අන්තයටම ගිහින්: ඔබ කියන්නේ කුමක්ද කියා ඇසීමටවත් ඔවුන්ට අවශ්‍ය නැහැ. නාටකයට අනුව ඔවුන්ගේ වාසනාව පැදුණු දිනයට ඔවුන් ඔබ වෙත එනු ඇත. ඔබට තරම් වාසනාවක් පැදුණු වෙනත් කිසිවෙකු වෙන කිසිම ආගමක නැහැ. බාබා පැහැදිලි කර දෙනවා : ඔබට ඉතා උසස් සතුටක් ලබා දෙනුයේ ඔබේ දිව්‍ය ආගම බව ඔබ තේරුම්ගන්න. බාබා කියනුයේ කුමක්ද එය ඉතා නිවැරදියි. ආගමික ග්‍රන්ථ වල කියනවා: රාවන් සහ කාන්ස් දිව්‍යලෝකයේ සිටින බව. එහි තිබෙන්නා වූ සතුට ගැන කිසිවෙකු දන්නේ නැහැ. මිනිස්සු දේවතාවන්ට වන්දනා කළද ඔවුන්ගේ බුද්ධියෙහි කිසිවක් රැඳී නොපවතී. බාබා දැන් ඔබෙන් අහනවා : "දරුවනි, ඔබ මාව සිහි කරනවාද? " මීට පෙර ඔබ කොතැනකදී හෝ අසා තිබෙනවාද පියෙක් දරුවෙකුට "මාව සිහිකරන්න" කියලා කියනවා? ලෞකික පියෙක් තම දරුවෙකුට කියනවද තමාව මේ ආකාරයට සිහිකරන්න කියලා? ඒ අසීමිත පියායි ඔබට පැහැදිලි කර දෙන්නේ. මුළු ලෝකයේම මුල, මැද සහ අග පිළිබඳව හොඳින් අවබෝධ කර ගැනීමෙන් ඔබ මුළු ලෝකයේම පාලකයින් බවට පත් වේ. ඔබ ප්‍රථමයෙන්ම නිවස වෙත යන අතර පසුව තම චරිත කොටස රඟ පෑමට පහළට පැමිණේ. කිසිවෙකුට තවම කිව නොහැකියි යම් කෙනෙකු අළුත් කෙනෙක්ද බොහෝ කලක් චක්‍රයේ සිටි පැරණි කෙනෙක්ද කියා. නව ජීවාත්මයක් අනිවාර්යෙන්ම ප්‍රසිද්ධියට පත්වනවා. බලන්න දැන් පවා ඇතැම් අය කොපමණ ප්‍රසිද්ධියක් උසුලනවාද කියා. ගැණිය නොහැකි පිරිසක් පැමිණෙනවා; ඔවුන් සුන් වූ බලාපොරොත්තු සහිතව පැමිණ හැඟීම් බරව නැවත යනවා. බාබා මොහුට ඇතුල් වූයේ බලාපොරොත්තු නොවූ ලෙසයි. එනිසා ඉන් යම් බලපෑමක් ඇති වුනි. අළුත් කෙනෙක් පැමිණී විට එය අනිවාර්යෙන්ම අනෙක් පැරණි අයට යම් හැඟීමක් ඇති කරවයි. අළුත් අතු රිකිලි හැදීගෙන එනවා. ඉතින් ඔවුන්ට ප්‍රශංසා කළ යුතුයි. කෙසේවෙතත්, කිසි කෙනෙකු තේරුම් ගන්නේ නැහැ ඇතැම් අය මෙතරම් ප්‍රසිද්ධියක් ලබන්නේ ඇයි කියලා. ඒ මන්ද, ඒ ජීවාත්මය අළුත් නිසා ඒ තුළ යම්කිසි අයුරකින් සිත ඇද ගැනීමේ බලයක් තිබෙනවා. බලන්න අදවන විට කොතරම් බොරු දෙවියෝ ඉන්නවද කියා. මේ නිසයි කියන්නේ සත්‍ය ඔරුව ගල් පර්වත වල හැපුණ ද එය කිසි විටෙක නොගිලේ. බාබා ඔබගේ ඔරුව පදවන්නා වනතෙක් ඔබ වෙත නොනැවතී කුණාටු හමා එයි. ඇතැම් දරුවන් ඇද වැටෙනවා; එහෙත් කුණාටු හැමීම නොනවතී. වෙනත් ආගමික සාකච්ඡා වලදී මෙලෙස කුණාටු සම්බන්ධව ගැටළුවක් පැණනොනගී. මේ ලෝකයේ අහිංසකයින් තමයි බොහෝ සෙයින්ම අන්‍යයන්ගෙන් පීඩාවට පත් වන්නේ. කෙසේවෙතත්, නිර්මාණය තවම සිදුවෙමිනුයි පවතින්නේ. බාබා පැහැදිලි කරනවා : අහෝ ජීවාත්මයනි. ඔබ කැලෑ කටු බවට පත් වී ඇත. ඔබ අන්‍යයන්ව කටු තුළින් ඉවතට ගන්නා සේම ඔබත් අන්‍යයන්ගෙන් ඉවතට යා යුතුයි. ඔබ දැනුමේ සෑම කරුණකටම පිළිතුරු දෙන්න. එහි කිසිම අයුරක නරක, දුක් ගෙනදෙන දෙයක් නැහැ. මේ නිසයි එම ස්ථානය දිව්‍යලෝකය ලෙස හඳුන්වන්නේ. මිනිස්සු දිව්‍යලෝකය සහ අපායක් ගැන කියනවා. නමුත් ඔවුන්ට කිසිවක් අවබෝධ කරගත නොහැකියි. ඔවුන් කියනවා එක් එක් පුද්ගලයා දිව්‍යලෝකයට ගියා කියලා. මෙලෙස පැවසීම පවා වැරදියි. අශරීරික ලෝකය දෙව්ලොව නොවෙයි. ඒ මුක්ති දේශයයි. තවම ඇතැම් අය කියනවා එක් එක් අය දිව්‍යලෝකයට ගියා කියලා. ඔබ තේරුම්ගන්න මෙහි නිවෙස් තිබෙන්නා සේම මුක්ති දේශය ජීවාත්මයන්ගේ නිවහනයි. භක්ති මාර්ගයේ ඇතැම් ධනවත් අය බොරුවට දේවාල බොහෝ සෙයින් හදනවා. බලන්න ඔවුන් ශිවා වෙනුවෙන් සාදන ලද දේවාල කෙසේද කියා. ඔවුන් ලක්ෂ්මි සහ නාරායනට ද දේවාල ඉදි කරන අතර ඔවුන්ව නියම රත්තරන් ආභරණ වලින් පුරවනවා. එහි බොහෝ ධනය තිබේ. අද කාලයේ සියල්ල බොරු බවට පත්වෙලා. ඔබ නියම අභරණ පැළඳුවා. අද මිනිස්සු ආණ්ඩුවට බය නිසා නියම ආභරණ සඟවා තබා බොරු ඒවා පළඳිනවා. දිව්‍යලෝකයේ ඇත්තේ සත්‍යය පමණයි; එහි අසත්‍ය කිසිවක් නැහැ. මෙහි ඔවුන්ට නියම ආභරණ තිබුණා වුවත් ඔවුන් එය සඟවනවා. දිනෙන් දින රත්තරන් වල වටිනාකම වැඩිවනවා. දිව්‍යලෝකයේදී ඔබ ලබන සෑම දෙයක්ම අළුත්. නව ලෝකයේ සෑම දේම අළුත් සහ එහි ඇත්තේ අසීමිත ධනයක්. දැන් බලන්න සෑම දේකම වටිනාකම ඉහළ නැඟ ඇති සැටි. අශරීරික ලෝකය ඇතුළුව සියලුම රහස් ඔබට පැහැදිලි කර දී තිබෙනවා. පරමාත්ම පියා හැර වෙන කාටද හැකියාව ඇත්තේ අශරීරික ලෝකයේ රහස් හෙළි කිරීමට? ඔබත් ගුරුවරුන් බවට පත්විය යුතුයි. ඔබට ඔබගේ පවුලේ අය සමග නිවසේ ජීවත්විය හැකි නමුත් නෙළුම් මලක් සේ පාරිශුද්ධව සිටිය යුතුයි. ඔබ අන්‍යයන්වත් ඔබගේ මට්ටමට ගෙන එන විට ඔබත් ඉහළ තත්ත්වයක් ලබනවා. මෙහි සිටින අයට වඩා උසස් තත්ත්වයක් ඔබට ලබාගත හැකියි; සෑම දෙනාම අනුපිළිවෙලයි. ඔබ පිට සිටියත්(මධ්‍යස්ථානයේ නොව, නිවසේ සිටියත්) ඔබට තවමත් ජයග්‍රහණයේ මල් දාමයේ රැඳී සිටිය හැකියි. දින 7 පාඩම් මාලාව ගන්න, පසුව පිටරට වලට හෝ ඕනෑම තැනක යා හැකියි. මුළු

ලෝකයටම පණිවිඩය ලැබිය යුතුයි. බාබා පැමිණ ඇත, ඔහු සරළව පවසන්නේ : නිරන්තරව මා පමණක් සිහිකරන්න! එම පියා ගැළවුම්කරු මෙන්ම මහ පෙන්වන්නාද වේ. ඔබ පිටරට වලට ගියහොත් පුවත්පත් වලින් ලොකු සේවයක් සිදු වේවි. අනෙක් අයටද මෙය සොයා ගැනීමට පහසු වනවා ඇත: ජීවාත්මය සහ ශරීරය යන දෙක එකිනෙකට වෙනස් දෙකක්. මනස සහ බුද්ධිය තිබෙන්නේ ජීවාත්මයේ එහෙත් ශරීරය අජීවීයි. ජීවාත්මය තමයි චරිත කොටසක් රඟපාන නළුවෙක් වන්නේ. ජීවාත්මයයි විශේෂ වන්නේ, ඉතින් එමනිසා, ඔබ දැන් පරමාත්ම පියා සිහිපත් කළ යුතුයි. මෙහෙ ඉන්න අය පිට ඉන්න අය තරම් වත් බාබා සිහිකරන්නේ නැහැ. බාබා හොඳින් සිහිකරන සහ අන්‍යයන් තමාගේ මට්ටමටම ගෙන කටු මල් බවට පත් කරන අය තමයි උසස් තත්ත්වයක් ලබන්නේ. ඔබ දන්නවා පෙර ඔබත් කටු ලෙස සිටියා. පරමාත්ම පියා දැන් ආඥාවක් නිකුත් කරනවා : රාගය මහා සතුරායි. එය පරාජය කිරීමෙන් ඔබ මුළු ලොවම ජය ගත්තා වේ. කෙසේවෙතත්, එම ලියා ඇති වචන වලින් කිසිවෙකුට කිසිවක් වැටහෙන්නේ නැහැ. බාබා දැන් සියල්ල පැහැදිලි කර දී ඇත. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණු දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. හංසයන් වී දැනුම නැමැති මිණිමුතු පමණක් අහුලා ගන්න. මුතු පමණක් තෝරාගෙන කුණු ඉවතලන්න. සෑම පියවරකදීම මිලියන ගණනින් උපයාගෙන මිලියන වාරයක් භාග්‍යවන්තයෙකු වන්න.
2. උසස් තත්ත්වයක් ලැබීම පිණිස ගුරුවරයෙකු වී බොහෝ දෙනෙකුට සේවය කරන්න. නෙළුම් මලක් සේ පාරිශුද්ධත්වය රැක අන්‍යයන්වත් තමාට සමාන කර ගන්න. කටු මල් බවට පත් කරන්න.

**වරදානය:** ඔබ දයානුකම්පිත වන අතර ඔබේ දයාවේ හැඟීම් මතුවීමට ඉඩ දීමෙන් "මගේ" සහ "ඔබේ" යන ඕනෑම කැලඹීමක් අවසන් කරත්වා.

කාලෙන් කාලෙට ජීවාත්ම ගණනාවක් දුක් රළ වලට හසු වෙනවා. ස්වභාවධර්මයේ සුළු කැළඹීමක් ඇති වූ විට, විපත් ඇති වූ විට, බොහෝ ජීවාත්ම දුක් විඳින අතර අනුකම්පාව ඉල්ලා සිටියි. එවැනි ජීවාත්මයන්ගේ කෑඳවීම ඔබට ඇසෙන විට, ඔබේ දයාවේ හැඟීම් මතුවීමට ඉඩ දෙන්න. ඔබගේ නමස්කාරයේ වටිනාකමට, දයානුකම්පිත ස්වරූපය අනුගමනය කිරීම පිළිගන්න. ඔබ සම්පූර්ණ වන විට මේ දුක් සහිත ලෝකය අවසන් වනු ඇත. දැන්, වේගවත් වේගයෙන් පරිවර්තනය සඳහා සුබ පැතුම් රළ විහිදුවන විට "මගේ" සහ "ඔබේ" පෙරළිය අවසන් වනු ඇත.

**පාඨය:** නාස්තිකාර සිතිවිලි මිටියකින් ප්‍රශ්න කන්දක් බිඳ දැමීමට උත්සාහ කරනවා වෙනුවට, එම කන්ද හරහා උස පිම්මක් පනින්න.

***** ඕම් ශාන්ති *****